# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2048/28 - 2017 දෙසැම්බර් මස 06 වැනි බදාදා - 2017.12.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32(ආ) සහ 33 වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව කබඩි ක්‍රීඩාව සඳහා ජාතික සම්මේලනය වන ශ්‍රී ලංකා කබඩි සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික කාර්යක්‍රමයක් වශයෙන් එකී ශ්‍රී ලංකා කබඩි සම්මේලනයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා 2017.12.04 වන දින සිට නිසි බලධාරියා වශයෙන් පත්කරන අතර, ශ්‍රී ලංකා කබඩි සම්මේලනයේ 2017 වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලය පත් කිරීම පිණිස ශ්‍රී ලංකා කබඩි සම්මේලනය මගින් නාමයෝජනා කැඳවා ඇති නිලවරණය පවත්වා අවසන් කිරීමට මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර,
ක්‍රීඩා අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

12 - 696


1A - G 26746 – 12 (2017/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*